# රුහුණ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා 2019.03.08 දින තෙක් මවිසින් අයදුම්පත් භාරගනු ලැබේ.

## 01. <u>මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම්:**

i. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ විභාගය සමත් වීම හා එම සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු වශයෙන් අවුරුදු 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් ක්‍රමය:** 2018.06.01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016(v) අනුව 2020.01.01 දින සිට රු.31,625 - 7×300; 10×355 - 37,275.00 [U MT 1(IIIA) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.27,794.00 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

## 02. <u>හෙද නිලධාරී (II ශ්‍රේණිය) තනතුර (කාන්තා)</u>

**අවශ්‍ය සුදුසුකම්:**

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 03 කට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

ii. ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලය මඟින් පිළිගනු ලබන හෙදි යෝග්‍යතා සහතිකයක් තිබීම.

**වැටුප් ක්‍රමය:** 2018.06.01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016(v) අනුව 2020.01.01 දින සිට රු.31,625 - 7×300; 10×355 - 37,275.00 [U MT 1(IIIA) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.27,794.00 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

***සැ.යු. අංක 01 - 02 දක්වා තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම සම්මුඛ පරීක්ෂණයක් මගිනි.***

## 03. ආරක්ෂක සේවා පරීක්ෂක (II ශ්‍රේණිය)

### අවශ්‍ය සුදුසුකම්:

(i) (අ) සම්මාන සාමාර්ථයන් පහක් (05) සහිතව විෂයයන් හයකින් (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම. සම්මාන ලත් විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුළත් විය යුතුය.

හෝ

(ආ) තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් (06) කින් සමත් වී ඇති විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක ස්ථිර සේවයක් තිබෙන විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ සේවකයෙකු වීම. එසේ සමත් වූ විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුළත් විය යුතුය.

සහ

(ii) පොලිස් සේවයේ හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ආරක්ෂක සේවයේ හෝ වෙනත් පිළිගත් ආරක්ෂක සේවා ආයතනයක වසර පහකට (05) නොඅඩු සතුටුදායක සේවයක් තිබිය යුතුය.

(iii) ක්‍රීඩා කටයුතුවල ක්‍රියාශීලී සහභාගීත්වය තිබිය යුතුය.

(iv) උස: අඩි 05 අඟල් 04 කට නොඅඩු විය යුතුය.
පපුව: අඟල් 34 කට නොඅඩු විය යුතුය. (සාමාන්‍ය)

**වැටුප් ක්‍රමය:** 2018.06.01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.30,725 - 17×300 - 35,825.00 [U-MN 1(IIIA)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.27,794.00 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

## 04. වැඩ අධිකාරී - සිවිල් (II ශ්‍රේණිය)

### අවශ්‍ය සුදුසුකම්:

i. තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා (සිවිල්) සහතික පත්‍රය හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබාගැනීමෙන් පසු අදාල ක්ෂේත්‍රය පිළිබඳව අවුරුදු 04 ක පළපුරුද්ද

**සටහන:** ප්‍රායෝගික පුහුණුවීමේ කාලසීමාව අදාල පලපුරුද්ද සඳහා සලකා බලනු නොලැබේ.

**හෝ**

ii. ජාතික තාක්ෂණ සහතිකය (සිවිල්) හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබාගැනීමෙන් පසු අදාල ක්ෂේත්‍රය පිළිබඳව අවුරුදු 10 ක පළපුරුද්ද

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.37,275 - 18×495 -

46,185.00 - [U-MN 2(II)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.33,714.00 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

***සැ.යු. අංක 03 - 04 දක්වා තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම සම්මුඛ පරීක්ෂණයක් මගිනි.***

## වෙනත් කරුණු:

- වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

- ඉහත මාසික වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

- විශ්වවිද්‍යාල සේවකයින් සිය මාසික මූලික වැටුපෙන් 10% කින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා දායක විය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් 15% කට සමාන මුදලක් (8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප සඳහා ද, 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ද බැර කෙරේ. විශ්වවිද්‍යාල පද්ධතියෙහි පත්වීම් දිනයේ සිට අනිවාර්ය විශ්‍රාම යාමේ දිනය දක්වා, එනම් වයස අවු. 60 දක්වා වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමට නොහැකි වන කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුපට දායක නොවන අතර, එම කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලෙහි සාමාජිකත්වය ද නොදරයි.) දායක කරනු ලැබේ.තවද ආයතනය විසින් මූලික වැටුපෙන් 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා බැර කරනු ලැබේ.

## අයදුම්පත් නිකුත් කිරීම සහ භාර ගැනීම:

අයදුම්කරුගේ ලිපිනය ලියන ලද මුද්දර ගැසූ සෙ.මී. 22×10 ප්‍රමාණයේ ලියුම් කවරයක් මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන) වෙත එවීමෙන් හෝ ආයතන අනධ්‍යයන අංශයට පැමිණ හෝ රුහුණ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියට පිවිසීමෙන් (www.ruh.ac.lk) නියමිත ආකෘති පත්‍රය හා බඳවා ගැනීම් පරිපාටියට අදාළ තොරතුරු ලබාගත හැකිය. 2019.02.28 දින තෙක් පමණක් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

නියමිත ආකෘතිය භාවිතා කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් "ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන), රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන ලද තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ හෝ අපැහැදිලි හෝ ඉහත සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සපුරා නොතිබීම හෝ නියමිත දිනට පෙර එවීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් කවර හේතුවක් නිසා හෝ නැවත සලකා බැලීමට අවකාශ නොමැත.

රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් සිය දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් මඟින් අයදුම්පත්

ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රුහුණ විශ්වවිද්‍යාලය, ලේඛකාධිකාරී
වැල්ලමඩම,
මාතර.
2019.02.07